JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති

## AAT අදියර I
## ECN - ආර්ථික විද්‍යාව


ප්‍රසාද් බාලසූරිය
LICA



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය Estd. 1972
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# 01. ව්‍යාපාර පරිසරයට අදාල ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති

**ආවරණය වන උපමාතෘකා**


1-1 ආර්ථික විද්‍යාව හඳුනා ගැනීම

1-2 අවශ්‍යතා හා වුවමනා

1-3 සම්පත්

1-4 මූලික ආර්ථික සංකල්ප

1-5 නිෂ්පාදන හැකියා මායිම පිළිබඳ මූලික හැදින්වීමක්

1-6 මූලික ආර්ථික ප්‍රශ්න

1-7 විවිධ ආර්ථික පද්ධති

1-8 ව්‍යාපාර පරිසරය තුළ ආර්ථික චර්යාවේ භූමිකාව

1-9 ප්‍රශ්න පොතට


## 1.1 ආර්ථික විද්‍යාව හඳුනා ගැනීම

විකල්ප භාවිත සහිත හිඟ සම්පත් හා අසීමිත වුවමනා අතර සම්බන්ධතාවය අධ්‍යයනය කරන විද්‍යාව ''ආර්ථික විද්‍යාව'' ලෙස හැඳින්වෙන අතර මෙහිදී මිනිසාගේ ආර්ථික ක්‍රියාකාරකම් හෝ හැසිරීම් දෙස අධ්‍යයනය කිරීමක් දක්නට හැකිය.

ආර්ථික විද්‍යාව තුල විද්‍යාත්මක ක්‍රමවේදය භාවිතා කරන බැවින් එය විද්‍යාවක් ලෙස හඳුනා ගන්නා අතර, ඒ තුලින් මිනිසාගේ හැසිරීම් විග්‍රහ කර අධ්‍යයනය කරන බැවින් එය සමාජ විද්‍යාවක් ලෙස තවදුරටත් හඳුනාගත හැක.

ශත වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ, ප්‍රබල වේගවත් සංවර්ධනයන්ට පාත්‍ර වෙමින් ආර්ථික විද්‍යා විෂයය සමාජීය විද්‍යාවන් අතර රැජිණ ලෙස කිරුළ හිමිකර ගෙන ඇත. වර්තමාන ලෝකය මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න බොහොමයක් ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සාකච්ඡා කෙරෙන අතර, මෙම විෂයය තුළ, එම ප්‍රශ්න විසඳා ගැනීම අරඹයා බුද්ධිමය මගපෙන්වීමක් කරනු දක්නට හැකිය.

යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය කෙරෙන භෞතික වුවමනා සපුරා ගැනීමට පුද්ගලයන් හා සමාජය ක්‍රියාත්මක වන ආකාරය හා ඊට අදාල තීරණ ගැනීම් ප්‍රවේශය, ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ මූලිකව සාකච්ඡා කෙරේ.

JMC vLearning "your virtual learning partner"

**ආර්ථික විද්‍යාව පිළිබඳ සුප්‍රසිද්ධ නිර්වචන කිහිපයක්**

"විකල්ප භාවිත සහිත හිඟ සම්පත් හා මිනිස් වුවමනා අතර පවතින සම්බන්ධතාවයේදී, මිනිස් හැසිරීම් අධ්‍යයනය කෙරෙන විද්‍යාවකි. "

– ලයනල් රොබින්ස්

"එදිනෙදා ව්‍යාපාරික ජීවිතයේදී මිනිසුන් කටයුතු කරන ආකාරය අධ්‍යයනය කරන විෂය යි. "

– ඇල්ෆ්‍රඩ් මාර්ෂල්

"ආර්ථික විද්‍යාව වූ කලී කිසියම් දර්ශනයක් හෝ මතවාදයක් නොව නිවැරදි නිගමන කරා එළඹීමට මනසට ආධාරකයන් සපයන මෙවලම් කට්ටලයකි."

– ජෝන් මේනාඩ්

## ආර්ථික විද්‍යාව හැදෑරීමේ ඇති ප්‍රයෝජන

- ආර්ථික සංසිද්ධියක් වඩාත් හොඳින් තේරුම් ගත හැකි වීම.
- රාජ්‍ය පාලන කටයුතු වලදී භාවිතා කල හැකි වීම.
- නිෂ්පාදකයන්ට, පාරිභෝගිකයන්ට හා ආයෝජකයින්ට ඵලදායි තීරණ ගැනීමට මැදිහත් වීම.
- ඡන්දදායකයන්ට වැදගත් වීම.
- පාසල් ශිෂ්‍යයන්ට තීරණ ගැනීමට වැදගත් වීම.

## සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යව

ආර්ථික විද්‍යාව ප්‍රධාන වශයෙන් කොටස් 02 කින් හඳුනාගත හැකිය.

➢ සූක්ෂම ආර්ථික විද්‍යාව
  - ආර්ථිකයේ එක් එක් අංශ වෙන් වෙන්ව ගෙන, ඒවායේ හැසිරීම අධ්‍යයනය කිරීම සූක්ෂම ආර්ථික විද්‍යාවයි.
  - නැතහොත් ආර්ථික පද්ධතියක් තුළ සිටින පාරිභෝගිකයන්, ශ්‍රමිකයන්, නිෂ්පාදන ආයතන හා රජය වැනි තීරණ ගන්නා විවිධ ඒකකයන්හි හැසිරීම විග්‍රහ කිරීම, සූක්ෂම ආර්ථික විද්‍යාව ලෙස හැඳින්විය හැක.
  - උදාහරණ
    - පාරිභෝගිකයෙකුගේ හැසිරීම
    - වෙළඳපොලක ඉල්ලුම සහ සැපයුම මත භාණ්ඩ මිල තීරණය වීම
    - හිඟකම, තේරීම, සම්පත් වෙන්කිරීම සහ ආවස්ථික පිරිවැය පිළිබඳ අධ්‍යයනය කිරීම.

JMC vLearning "your virtual learning partner"

- සාර්ව ආර්ථික විද්‍යාව
  - කිසියම් ආර්ථික පද්ධතියක් සමස්තයක් ලෙස ගෙන, එහි ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම, සාර්ව ආර්ථික විද්‍යාවයි.
  - නැතහොත් කිසියම් ආර්ථික පද්ධතියක්, සමස්ථයක් ලෙස ගෙන එහි ව්‍යුහය, සාධනය හා හැසිරීම පිළිබද විශ්ලේෂණය කිරීම සාර්ව ආර්ථික විද්‍යාව ලෙස හැදින්විය හැක.
  - උදාහරණ
    - ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනය අධ්‍යයනය කිරීම
    - ආර්ථිකයේ සමස්ත මිල මට්ටම අධ්‍යයනය කිරීම
    - ආර්ථිකයේ සේවා නියුක්තිය අධ්‍යයනය කිරීම

## යථානුරූපී ආර්ථික විද්‍යාව හා අභිමතානුරූපී ආර්ථික විද්‍යාව

- යථානුරූපී ආර්ථික විද්‍යාව
  - යමක් අතීතයේ පැවතුන ආකාරයත්, වර්තමානයේ පවතින ආකාරයත්, අනාගතයේ පැවතිය හැකි ආකාරයත් සම්බන්ධව අධ්‍යයනය කිරීමයි.
  - කිසියම් විචල්‍යයන් කිහිපයක් අතර පවත්නා සම්බන්ධතාවය පෙන්වා දීමට හෝ පැහැදිලි කිරීමට යථානුරූපී ප්‍රකාශ උපයෝගී කර ගනී. මෙය ප්‍රකාශ විද්‍යාත්මක ස්වරූපයක් ගනී.
  - උදාහරණ
    - භාණ්ඩ මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.
    - ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22 කි.

- අභිමතානුරූපී ආර්ථික විද්‍යාව
  - සිදුවිය යුත්තේ කුමක්ද යන්න පිළිබද අධ්‍යයනය කිරීම, අභිමතානුරූපී ආර්ථික විද්‍යාවෙන් සාකච්ඡා කෙරේ.
  - මෙවැනි ප්‍රකාශ පුද්ගල බද්ධ ස්වරූපයක් උසුලන අතර එවැනි ප්‍රකාශයක නිරවද්‍යතාවය විද්‍යාත්මක පදනමකින් පරීක්ෂණයට ලක් කල නොහැක.
  - උදාහරණ
    - සමස්ත ජීවන තත්ත්වය ඉහල යාමට නම්, ආර්ථික වර්ධනය සියළු ජන කොටස් අතරේ සාධාරණව බෙදී යා යුතුය.
    - පරිසරය ආරක්ෂා කිරීමට රජය පියවර ගත යුතුය.

JMCvLearning "your virtual learning partner"

## 1.2 අවශ්‍යතා හා වුවමනා

| අවශ්‍යතා | උවමනා |
|---|---|
| * මිනිසෙක් වශයෙන් ජීවත් වීමට අවශ්‍ය මූලිකම දෑ වේ. | *අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූපයන් වේ. |
| * අවශ්‍යතා සීමිතය. | * වුවමනා අසීමිතය. |
| * අවශ්‍යතා ප්‍රාථමික වේ. | * වුවමනා ද්විතියික වේ. |
| * අනිවාර්යයෙන් සපුරා ගත යුතුය. | * අනිවාර්යයෙන් සපුරා ගත යුතු නොවේ. |
| * ප්‍රචාරණයෙන් වෙනස් කළ නොහැක. | * ප්‍රචාරණයෙන් වෙනස් කළ හැකිය. |
| උදාහරණ: | උදාහරණ: |

## 1.3 සම්පත්

සම්පත්,

- යනු, මිනිස් වුවමනා සපුරාලිය හැකි ඕනෑම දෙයකි.
- සම්පත් ප්‍රධාන කොටස් 2 කි.
    - ආර්ථික සම්පත්
    - ආර්ථික නොවන සම්පත්

| ආර්ථික සම්පත් | ආර්ථික නොවන සම්පත් |
|---|---|
| ❖ සැපයුම සීමාසහිත වේ.<br>❖ සම්පාදනය කිරීමට සම්පත් පිරිවැයක් දරා ඇත.<br>❖ ආවස්ථික පිරිවැයක් පවතී.<br>❖ බොහෝවිට මිලක් දක්නට ඇත.<br><br>උදා: ගොඩනැගිලි<br>යන්ත්‍රසූත්‍ර<br>ශ්‍රමය<br>අමුද්‍රව්‍ය | ❖ සැපයුම අසීමිත වේ.<br>❖ සම්පාදනය කිරීමට සම්පත් පිරිවැයක් දරා නැත.<br>❖ ආවස්ථික පිරිවැයක් නැත.<br>❖ මිලක් දක්නට නැත.<br>(එබැවින් නොමිල භාණ්ඩ ලෙසද හඳුන්වයි.)<br>උදා: හිරුඑළිය<br>සුළඟ |

ඉහත සාකච්ඡා කල ආකාරයට, ආර්ථික සම්පත් ප්‍රධාන කොටස් හරතකින් සමන්විත වේ. මේවා නිෂ්පාදන සාධක ලෙසද හඳුන්වයි.

1. භූමිය
2. ශ්‍රමය
3. ප්‍රාග්ධනය
4. ව්‍යවසායකත්වය



JMC vLearning "your virtual learning partner"

## 1. භූමිය

- යනු ස්වභාවධර්මයාගේ දයාදයක් ලෙස මිනිසාට ලැබී ඇති, නිෂ්පාදනයට යොදාගත හැකි සියළු සම්පත් වේ.

- මෙය ප්‍රධාන කොටස් 02 කි.

  - ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්
    උදා: ගල් අඟුරු, ඛනිජ තෙල්, යපස්
  - ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්
    උදා : මත්ස්‍ය සම්පත, වන සම්පත

- භූමි සාධකයේ ප්‍රධාන ලක්‍ෂණ කිහිපයකි.

  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................

- භූමිය සාධකයේ ඉපැයුම "බදු කුලිය" වේ.

- උදාහරණ:

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

## 2. ශ්‍රමය

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදාගත හැකි සියළුම කායික හා මානසික සම්පත් "ශ්‍රමය" ලෙස හඳුන්වයි.

- නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමයේ ලක්‍ෂණ පහත පරිදි හඳුනාගත හැක.

  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................
  ✓ ..........................................................................................

- ශ්‍රම සාධකයේ ඉපැයුම "වැටුප්" වේ.

- උදාහරණ:

..........................................................................................
..........................................................................................
..........................................................................................

JMC vLearning "your virtual learning partner"

## 3. ප්‍රාග්ධනය

- යනු, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට ආධාර කර ගන්නා, මිනිසා විසින් නිෂ්පාදිත ආධාරකයන්ය.
- මේවා අවසන් පරිභෝජනයට යොදා නොගන්නා අතර, භාණ්ඩ සේවා නිෂ්පාදනයට යොදා ගනී.
- ප්‍රාග්ධන සාධකයේ මූලික ලක්‍ෂණ පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………

- ප්‍රාග්ධන සාධකයේ ඉපැයුම "පොලිය" වේ.
- උදාහරණ:

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………

## 4. ව්‍යවසායකත්වය

- යනු, අනෙකුත් සම්පත් නිසි ලෙස සංවිධානය කරමින්, ව්‍යාපාර අවදානම් දරමින් නව්‍යතා සම්පාදනය කිරීමේ ප්‍රයත්නයයි.
- ව්‍යාවසායකත්වය තුලින් නව භාණ්ඩ / සේවා, නව උපකරණ, නව ශිල්ප ක්‍රම හඳුන්වා දෙයි.
- ව්‍යවසායකත්වයේ කාර්යභාරය පහත පරිදි පෙළ ගැස්විය හැක.

  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………
  ✓ ……………………………………………………………………………………………

- ව්‍යවසායකත්වයේ ඉපැයුම "ලාභය" වේ.

JMC vLearning "your virtual learning partner"

## 1.4 මූලික ආර්ථික සංකල්ප

**අ. හිඟකම**

- යනු, මිනිස් වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීමයි.
- හිඟකම පැන නැගීමට හේතු 02 කි.
  - මිනිස් වුවමනා අසීමිත වීම
  - වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය සම්පත් සීමාසහිත වීම
- හිඟකම තුලින් පහත ප්‍රධාන කරුණු අවධාරණය කෙරේ.

✓ ........................................................................................................
✓ ........................................................................................................
✓ ........................................................................................................
✓ ........................................................................................................

**ආ. තෝරා ගැනීම / තේරීම**

- පහත හේතු කාරණා මුල් කරගෙන සෑම සමාජයක්ම තේරීම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙනු ඇත.

* සම්පත් හිඟකම

* සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම

- සෑම සමාජයක්ම සිදුකළයුතු මූලික තෝරා ගැනීම් තුනකි.

i. කුමක්, කොපමණ ප්‍රමාණයක් නිපදවන්නේද?

ii. කෙසේ නිපදවන්නේද?

iii. කා සඳහා නිපදවන්නේද?

**ඇ. ආවස්ථික පිරිවැය**

- යනු, කිසියම් තෝරා ගැනීමක් හේතුවෙන්, අත්හැර දැමීමට සිදුවන හෙවත් කැප කිරීමට සිදුවන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකමයි.
- ආවස්ථික පිරිවැය සම්බන්ධයෙන් අවධාරණය කෙරෙන ප්‍රධාන කරුණු කිහිපයකි.

✓ ........................................................................................................
✓ ........................................................................................................
✓ ........................................................................................................
✓ ........................................................................................................

- උදාහරණ:

පුද්ගලයෙක් නිවාඩු දිනයකදී සිදු කිරීමට අපේක්ෂා කරන විකල්ප අවස්ථා 02 ක් පවතින්නේ යැයි සිතමු.

අ) යහළුවන් සමඟ විනෝද චාරිකාවක් යාම



JMCVLearning your virtual learning partner

ආ) නව කතාවක් කියවීම

ඔහු තෝරා ගත්තේ යහළුවන් සමඟ විනෝද චාරිකාවක් යාම නම්, එහි ආවස්ථික පිරිවැය වන්නේ නව කතාවක් කියවීමෙන් ලබන තෘප්තියයි.

- ආවස්ථික පිරිවැය ශූන්‍ය වන ප්‍රධාන අවස්ථා 3 කි.

✓ ..........................................................................................................
✓ ..........................................................................................................
✓ ..........................................................................................................

**ඉ.. භාණ්ඩ හා සේවා**


- මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට භාවිතා කරන ඕනෑම දෙයක් ''භාණ්ඩයක්'' ලෙස හඳුන්වයි.
- හිඟකම හා ආවස්ථික පිරිවැය මත භාණ්ඩ සේවා වර්ග දෙකකට බෙදේ.
  1. ආර්ථික භාණ්ඩ
  2. ආර්ථික නොවන භාණ්ඩ

| | ආර්ථික භාණ්ඩ | | ආර්ථික නොවන භාණ්ඩ |
|---|---|---|---|
| * | සැපයුමේ හිඟකමක් දක්නට ලැබීම. | * | සැපයුමේ හිඟකමක් දක්නට නොලබයි. |
| * | | * | |
| * | | * | |
| * | | * | |
| * | | * | |
| * | | * | |

## 1.5 නිෂ්පාදන හැකියා මායිම පිළිබඳ මූලික හැඳින්වීමක්

කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුල, ආර්ථිකයක් සතු සියළුම සම්පත්, පවත්නා උපරිම තාක්ෂණය යටතේ යොදා ගත් විට, කිසියම් භාණ්ඩ යුගලයකින් ලබාගත හැකි උපරිම භාණ්ඩ සංයෝජනයක් නිරූපණය කරමින් ගොඩ නංවා ඇති ආදර්ශය "නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය" ලෙස හඳුන්වයි.

JMC vLearning "your virtual learning partner"




නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ගොඩනැංවීමේදී පහත උපකල්පන භාවිතා කෙරේ.

- ✓ ..............................................................................................................
- ✓ ..............................................................................................................
- ✓ ..............................................................................................................
- ✓ ..............................................................................................................

**නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය තීරණය වීම**

* නිෂ්පාදන හැකියා මායිම වක්‍රයේ හැඩය තීරණය වන්නේ ආවස්ථික පිරිවැයේ හැසිරීම මතය.

* ඒ අනුව නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මූලික හැඩයන් වර්ග 3 කි.


- ✓ ..............................................................................................................
- ✓ ..............................................................................................................
- ✓ ..............................................................................................................

| **නිෂ්පාදන හැකියා මායිමේ හැඩය** | ____________________ | ____________________ | ____________________ |
|---|---|---|---|
| රූප සටහන |  |  |  |
| නිෂ්පාදන හැකියා මායිමේ හැඩයට හේතුව | ..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>.................................. | ..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>.................................. | ..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>..................................<br>.................................. |


JMC vLearning "your virtual learning partner"

නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර තුලින් පහත ආර්ථික සංකල්ප පැහැදිලි කල හැක.


**අ. සම්පත් හිඟකම**





**ආ. විකල්ප ප්‍රයෝජන පැමිණිම**




**ඇ. නිෂ්පාදන කාර්යක්ෂමතාවය**





**ඈ. නිෂ්පාදන අකාර්යක්ෂමතාවය**





JMC vLearning "your virtual learning partner"


ඉ. ආර්ථික වර්ධනය





ඊ. ආර්ථික පසුබැස්ම




උ. ආර්ථික පිරිවැය




ඌ. තාක්ෂණික දියුණුව




JMC vLearning "your virtual learning partner"

## 1.6 මූලික ආර්ථික ප්‍රශ්න

සම්පත් හිඟකම කේන්ද්‍රීය ප්‍රශ්නය ලෙස ගෙන, සෑම සමාජයක්ම මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න තුනකි.

1. කුමක්, කොපමණ නිපදවන්නේද?
2. කෙසේ නිපදවන්නේද?
3. කා සඳහා නිපදවන්නේද?

**කුමක් කොපමණ නිපදවන්නේද?**

- ආර්ථිකය සතු සම්පත් හිඟ බැවින් සමාජයට අවශ්‍ය සියළු භාණ්ඩ නිපදවා ගත නොහැකි බැවින් කුමන භාණ්ඩ, කොපමණ ප්‍රමාණයක් නිපදවා ගත යුතුද යන ප්‍රශ්නයට මුහුණ දෙයි.

**කෙසේ නිපදවන්නේද?**

- භාණ්ඩ සේවා නිෂ්පාදනය කිරීමට හිඟ සම්පත් කවර ආකාරයට මිශ්‍ර කළ යුතුද? කවර තාක්ෂණයක් හා ශිල්ප ක්‍රමයක් අනුගමනය කල යුතුද යන්න තීරණය කිරීම මෙහි අදහසයි.
- භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන ශිල්ප ක්‍රම දෙකක් පවතින අතර, යෝග්‍ය නිෂ්පාදන ශිල්ප ක්‍රමය තීරණය කිරීම මෙහිදී සිදු වේ.

  1. ප්‍රාග්ධන සූක්ෂම ශිල්ප ක්‍රම
     ..........................................................................................................
     ..........................................................................................................
  2. ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමය
     ..........................................................................................................
     ..........................................................................................................

**කා සඳහා නිපදවන්නේද?**

- එනම් නිෂ්පාදනය කරන භාණ්ඩය / සේවාව කවර පිරිසක් ඉලක්ක කරමින් සිදු කළ යුතුද යන්නයි.
- එනම් නිෂ්පාදනය බෙදා හරින ආකාරය තීරණය කිරීමයි.
- මෙය මිලදී ගැනීමේ හැකියාව මත තීරණය කෙරෙන අතර, ඒ අනුව ආර්ථිකයක;
  * ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් ඇති අය
  * පහළ මිලදී ගැනීමේ හැකියාවක් ඇති අය

යනුවෙන් කොටස් දෙකක් හඳුනාගත හැක.

## 1.7 විවිධ ආර්ථික පද්ධති

ඉහත පරිච්ඡේදය තුල අප සාකච්ඡා කරන ලද, මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මිනිසා විසින් නිර්මාණය කරන ලද යාන්ත්‍රණය "ආර්ථික පද්ධතියක්" ලෙස හඳුන්වයි.

ආර්ථික පද්ධතියක් තුල අනිවාර්යයෙන් දැකිය හැකි මූලික ලක්ෂණ කිහිපයකි.



JMC vLearning "your virtual learning partner"

1. නිෂ්පාදන සම්පත් පිළිබඳ හිමිකාරීත්වය
2. හිඟ සම්පත් බෙදා වෙන් කිරීම සම්බන්ධ තීරණ ගැනීම හා සම්බන්ධීකරණ යාන්ත්‍රණය
3. අභිප්‍රේරණය කිරීම සඳහා වන සානුබල පද්ධති

**ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන මූලිකාංග**

- .......................................... - ..........................................
- .......................................... - ..........................................
- .......................................... - ..........................................
- .......................................... - ..........................................

මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන ආර්ථික පද්ධති තුනක් හඳුනා ගත හැක.

1. වෙළඳපොල ආර්ථික පද්ධති
2. විධානගත / සැලසුම්ගත ආර්ථික පද්ධති
3. මිශ්‍ර ආර්ථික පද්ධති

## වෙළඳපොල ආර්ථික පද්ධති

✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................
✓ ..........................................................................................................................

**මිල යාන්ත්‍රණය**

➢ පාරිභෝගිකයන් ස්වාර්ථය පදනම් කරගෙන, තමන් කැමති භාණ්ඩ සේවා අඩුම මිලට ලබා ගැනීමට අපේක්ෂා කරයි.
➢ නිෂ්පාදකයන් තමන්ට කැමති භාණ්ඩ වැඩිම මිලට විකුණා ලාභ වැඩි කර ගැනීම අපේක්ෂා කරයි.
➢ මෙලෙස ස්වාර්ථය පදනම් කර තීරණ ගනු ලබන පාරිභෝගික හා නිෂ්පාදක යන දෙපාර්ශවයන්ගේ තීරණ සම්බන්ධීකරණය කෙරෙන අදෘශ්‍යමාන බලවේගය ලෙස "මිල" වෙළඳපල ක්‍රමය මෙහෙයවයි.

වෙළඳපොල ආර්ථිකයක මිලේ කාර්යයන් ප්‍රධාන වශයෙන් 03 කි.

* ..........................................................................................................................

* ..........................................................................................................................

* ..........................................................................................................................

**වෙළඳපොල ක්‍රමයේ හිතකර ලක්‍ෂණ**

- ➢ සම්පත් බෙදීයාම කාර්යක්‍ෂම වීම.
  එනම් සමාජයේ ඉල්ලුම අනුව භාණ්ඩ සේවා නිෂ්පාදනයට සම්පත් යෙදෙවෙන බැවින්, සම්පත් බෙදීයාම කාර්යක්‍ෂම වීම.
- ➢ පෞද්ගලික නිදහස
  පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් දෙපාර්ශවයටම නිදහසේ තීරණ ගැනීමේ අවස්ථාව පැවතීම හා තමන් කැමති ව්‍යාපාරවල නිරත වී ලාභ ඉපැයීමේ හැකියාව පැවතීම.
- ➢ තරඟකාරීත්වය
  තරඟකාරීත්වය තුලින් කාර්යක්‍ෂමතාව හා ඵලදායීතාවය වර්ධනය වී අඩු මිලට භාණ්ඩ ලබාගත හැකි වීම.

**වෙළඳපොල ක්‍රමයේ අහිතකර ලක්‍ෂණ**

- ➢ ආදායම් බෙදීයාමේ විෂමතා ඇති වීම.
- ➢ සාර්ව ආර්ථික අස්ථායීතාවයන් නිර්මාණය වීම.
  එනම් මෙහිදී සේවා වියුක්තිය, උද්ධමනය, ගෙවුම් ශේෂ අසමතුලිතතා ඇති වීම.
- ➢ පොදු භාණ්ඩ සම්පාදනය නොවීම.
- ➢ සුභසාධක භාණ්ඩ නිෂ්පාදනය ධෛර්යයමත් නොවීම.
- ➢ බාහිරතා සැලකිල්ලට නොගැනීම.
- ➢ පෞද්ගලික ඒකාධිකාරී තත්ත්ව යටතේ පාරිභෝගිකයා සූරා කෑමකට ලක් වීම.
- ➢ ප්‍රචාරණය තුලින් පාරිභෝගික වරණයට බලපෑම් කිරීම.

## විධානගත / සැලසුම්ගත ආර්ථිකය

සැළසුම්ගත අර්ථ ක්‍රමයක් පහත මූලික ලක්‍ෂණ වලින් සමන්විතය.

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

✓ ..........................................................................................................................

කෙසේවෙතත්, සැළසුම්ගත ක්‍රමයක් හරහා පහත හිතකර ලක්‍ෂණ මෙන්ම අහිතකර ලක්‍ෂණද දක්නට ලැබෙනු ඇත.

JMC eLearning "your virtual learning partner"

**හිතකර ලක්ෂණ**

- පොදු භාණ්ඩ සැපයීම සඳහා සම්පත් ප්‍රමාණවත්ව බෙදා වෙන් කිරීම සහතික කිරීම.
- බාහිරතා සැලකිල්ලට ගනිමින්, මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම.
- තරඟකාරීත්වය තුළින් පැන නැගෙන ආකාර්යක්ෂමතා ඉවත් කල හැකි වීම.
- ආර්ථිකය පිළිබඳ දිගු කාලීන දැක්මක් ඇතිව කටයුතු කිරීම.
- ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම.
- වෙළඳපල ක්‍රමයක දැකිය හැකි සූරා කෑමේ ලක්ෂණ ඉවත් කළ හැකි වීම.

**අහිතකර ලක්ෂණ**

- භාණ්ඩ හා සේවා විශාල සංඛ්‍යාවක් නිපදවන සංකීර්ණ ආර්ථිකයක, භාණ්ඩ හිඟ / අධි සැපයුම් තත්ත්ව ඇති නොවන පරිදි සැපයුම සැලසුම් කිරීමේ අපහසුතාවය.
- නිළධාරීවාදය තුලින් අකාර්යක්ෂමතා පැන නැගීම.
- නව තාක්ෂණය, නව්‍යතා සම්පාදනය ආදියට අවශ්‍ය පෙළඹවීම් නොමැති වීමෙන්, නිෂ්පාදන ආකාර්යක්ෂමතා ඇති වීම.
- පාරිභෝගික ස්වාධිපත්‍යයක් දක්නට නොලැබීම.
- එක්තරා අවස්ථාවකින් පසු, ආර්ථික වර්ධනය මන්දගාමීව හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අපොහොසත් වීම.
- සංවිධානය හා සම්බන්ධීකරණ ගැටළු පැන නැගීම.

## මිශ්‍ර අර්ථ ක්‍රමය

මිශ්‍ර අර්ථ ක්‍රමයක් තුළ පහත මූලික ලක්ෂණ දැකිය හැකිය.

- ✓ ........................................................................................................................
- ✓ ........................................................................................................................
- ✓ ........................................................................................................................
- ✓ ........................................................................................................................
- ✓ ........................................................................................................................
- ✓ ........................................................................................................................

එක් එක් අර්ථ ක්‍රම විසින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය

1. **කුමක් නිපදවන්නේද?**

| වෙළඳපොල ආර්ථිකය | සැලසුම්ගත ආර්ථිකය | මිශ්‍ර ආර්ථිකය |
|---|---|---|
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |
| ________________ | ________________ | ________________ |

JMC vLearning your virtual learning partner

2. කෙසේ නිපදවන්නේද?

| වෙළඳපොල ආර්ථිකය | සැලසුම්ගත ආර්ථිකය | මිශ්‍ර ආර්ථිකය |
|---|---|---|
| | | |

3. කා සඳහා නිපදවන්නේද?

| වෙළඳපොල ආර්ථිකය | සැලසුම්ගත ආර්ථිකය | මිශ්‍ර ආර්ථිකය |
|---|---|---|
| | | |

## 1.8 ව්‍යාපාර පරිසරය තුළ ආර්ථික චර්යාවේ භූමිකාව

සංකීර්ණ, ගතික ව්‍යාපාර පරිසරය තුළ ක්‍රියාත්මක වන නූතන ව්‍යාපාර, තම අරමුණු ලඟා කර ගැනීමට යාමේදී මුහුණ දෙන අභියෝගාත්මක ප්‍රශ්න හමුවේ ආර්ථික විද්‍යාවේ මූලධර්ම වඩා වැදගත් වනු ඇත. කාර්යක්ෂම ලෙස ව්‍යාපාර අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ව්‍යාපාර කළමනාකරුවන්ට ආර්ථික විද්‍යාව පහත අවස්ථා වලදී අත්‍යාවශ්‍ය වනු දක්නට හැකිය.

- භාණ්ඩ මිල හා නිපදවිය යුතු ප්‍රමාණය තීරණය කිරීමට
- භාණ්ඩයක් නිෂ්පාදනය කළ යුතු ද නැතහොත් වෙනත් නිෂ්පාදකයන්ගෙන් මිලදී ගත යුතු ද යන්න තීරණය කිරීමට
- නිෂ්පාදන ශිල්ප ක්‍රමය තීරණය කිරීමට
- ප්‍රචාරණය කළ යුතු මාධ්‍ය තීරණය කිරීමට
- නිමි හෝ අමුද්‍රව්‍ය තොග මට්ටම් තීරණය කිරීමට
- නව ආයෝජන සිදු කිරීමේ හෝ ආයෝජන මූල්‍යාණය කිරීමේ ක්‍රම තීරණය කිරීමට
- සේවකයන් බඳවා ගැනීම හා පුහුණු කිරීමේ, ශිල්ප ක්‍රම තීරණය කිරීමට.

JMC vLearning "your virtual learning partner"

## 1.9 ප්‍රශ්න පොතට

1. **මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (වගුවක් ආශ්‍රයෙන්)**

2. **ආර්ථික සම්පත්, ආර්ථික නොවන සම්පත් වලින් වෙනස් වන්නේ කෙසේද?**

3. **ප්‍රධාන නිෂ්පාදන සම්පත් ලැයිස්තුගත කරන්න.**

4. **නිෂ්පාදන සාධක ප්‍රධාන කොටස් හතර නම් කර ඒවායේ ආර්ථික ඉපැයුම වෙන් වෙන්ව සඳහන් කරන්න.**

5. **සම්පත් හිඟකම කෙටියෙන් පැහැදිලි කරන්න.**

6. **ආවස්ථික පිරිවැය උදාහරණ සහිතව පහදන්න.**

7. **නිෂ්පාදන හැකියා මායිමක් නිර්මාණය කිරීමේ මූලික උපකල්පන කවරේද?**

8. **මූලික ආර්ථික ප්‍රශ්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

9. **මධ්‍ය සැලසුම් අර්ථ ක්‍රමයක්, වෙළඳපල ක්‍රමයකින් වෙනස් වන්නේ කෙසේද? (වගුවක් ඇසුරෙන්)**

10. **ශ්‍රී ලංකාවේ ඔබ දකින අර්ථ ක්‍රමය කුමක්ද? එවැනි අර්ථ ක්‍රමයක ලක්‍ෂණ කවරේද?**

11. **මිශ්‍ර ආර්ථිකයක ප්‍රධාන ලක්‍ෂණ කවරේද?**

JMC vLearning "your virtual learning partner"

අමතර සටහන්

JMC vLearning "your virtual learning partner"

JMC vLearning "your virtual learning partner"

JMC vLearning "your virtual learning partner"